# ටයරයක් විකිණීමටත් කාන්තා අඩ නිරුවත:

# රුපියල් සත සමාජයේ හර පද්ධතිය වඳ බැහැලා

රෝෂන් තුසාර්

සිංහල ගැමි කාන්තාව එදා සිට හැඩ ගැසුණේ සදාචාර සම්පන්න හික්මීමෙන් යුතු සමාජයක බවත්, ඉල්ලීම් හෝ උද්ඝෝෂණ ඇය ගෝචර නොවූ බවත් ජාතික පිළිකා රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ලසන්ත ආරියරත්න මහතා පැවැසීය.

ඒ මහතා එසේ කීවේ ශ්‍රී ලංකා එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධාන (ෂන්ෆෝ) නව කාර්යාලය විවෘත කිරීමේ, එම සංවිධානයේ කාන්තා සංවිධානයක් පිහිටුවා ගැනීම නිමිත්තෙන් කොළඹ මෝදර පොලිසිය ඉදිරිපිට නව කාර්යාලයේ දීය.

ශ්‍රී ලංකා - එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානයේ කාන්තා ඒකකයේ සභාපතිනි මානෙල් අයිලප්පෙරුම මහත්මිය විසින් පළමු සැසිවාරය ආරම්භ කිරීමෙන් අනතුරුව මේ රැස්වීම පැවැත්විණි.



ශ්‍රී ලංකා - එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානයේ (SUNFO) කාන්තා ඒකකයේ ආරම්භක සැසිවාරය එහි සභාපතිනි මානෙල් අයිලප්පෙරුම මහත්මිය අමතන අයුරු. ජාතික පිළිකා රෝහලේ අධ්‍යක්ෂක දෙස්තර ලසන්ත ආරියරත්න, සන්ෆෝ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය දේශප්‍රිය එස්. විජේතුංග හා කේ. එම්. එස්. බී. තෙන්නකෝන් යන මහත්වරු සහ ඉද්දමල්ගොඩ මහත්මිය ද ඡායාරූපයේ සිටිති.

(ඡායාරූපය - රවීන්ද්‍ර සෙනෙවිරත්න)

තවදුරටත් කථා කළ වෛද්‍ය ආරියරත්න මහතා, කාන්තා අයිතිවාසිකම්, අරගල හා ඉල්ලීම් පසුපස හඹා නොගිය කාන්තාව අද මෙන් බෝඩ් ලෑලි උස්සා ගෙන පිකට් කිරීමට නොපෙළඹුන බවත්, එසේ වුවත් එදා කාන්තාව අදට වඩා නිදහස භුක්ති විඳි බවත්, ඇය නිතරම තම ස්වාමියාගේ හා සමාජයෙන් අරගල නොකර තම ඉල්ලීම් දිනාගත් බවත් කීවේය.

කාන්තාවන්ගේ ජන්ම උරුමයන්ගෙන් එදා කාන්තාව නිතර ප්‍රයෝජන ගත් අතර, අප ස්ත්‍රී මායම් ලෙස හඳුන්වන දේ එදා කාන්තාව නියම පරිදි ප්‍රයෝජනයට ගත් බවද ඒ මහතා කීය.

"ස්ත්‍රී මායම්" යනු පහත් නැතහොත් සමාජය පිළිකුල් කළ යුතු දෙයක් නොවේ. එය කාන්තාවකගේ උරුමය වේ. නමුත් අද මහ පාරේ පිකට් කරන කාන්තාවන්ට ස්ත්‍රී මායම්වත්, පුරුෂ ගතිවත් පිහිටා නැත. ඔවුන් ඒ දෙකටම නැති අතර මැදි පිරිසක් පමණයි.

උපන් හැකියා නැතිකර ගත් කාන්තාවනට අන්‍ය පුරුෂ හැකියාවන්ට ළඟාවියනොහැකි බව ද ඒ මහතා පැවසීය.

සමාජ සංස්කෘතින් සාරධර්ම හා කාන්තාවගේ බද්ධවීම පිළිබඳ අදහස් දැක්වූ ඒ මහතා බහු ස්ත්‍රී සේවනය විදේශයන් හි ව්‍යාප්තව පැවතුනද ඊට ප්‍රතිවිරුද්ධ සාමකාමී සංස්කෘතියක් දේශීයව ව්‍යාප්ත වී තිබුණු බව පෙන්වා දෙන ලදී. බදුල්ල - මාතර හා උඩරට ව්‍යාප්තව ඇති එම සමාජ රටාව එකගෙයි කෑම නම් වේ. එවැනි සමාජ රටාවක් උරුම කරගත් කාන්තාවට අද වන විට සංකීර්ණ සමාජයන් සමඟ ප්‍රශ්න රැසකට මුහුණ දීමට සිදුව ඇති බවද ඒ මහතා පෙන්වා දුන්නේය.

මෙහිදී අදහස් දැක්වූ ඉද්දමල්ගොඩ මහත්මිය අද දිනයේ ටයරයක් විකිණීමටත් කාන්තා අඩනිරුවත අවශ්‍ය වී ඇති බවද, කාන්තාව එපමණකටම ලාභවී ඇති බවද පැවැසුවාය. තවදුරටත් අදහස් දැක්වූ ඒ මහත්මිය, අද පවතින සංකීර්ණ සමාජ රටාව තුළ කාන්තාවනට උපදේශන සේවා සැපයීමේ අවශ්‍යතාව පැහැදිලි කළාය.

මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් දේශප්‍රිය එස්. විජේතුංග, ක්‍රීඩා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කේ. එම්. එස්. බී. තෙන්නකෝන්, මිත්‍රත්ව සංවිධානයේ සභාපතිනි මානෙල් අයිලප්පෙරුම සහ එම සංවිධානයේ නිලධාරී මහත්වරු ඇතුළු සම්භාවනීය පිරිසක් සහභාගි වූහ.

මෙහිදී 'දිනමිණ' පුවත්පත අනුග්‍රහයෙන් එම සංවිධානය දිප ව්‍යාප්තව පැවැත්වූ "සංවර්ධනය උදෙසා ගැමි කාන්තාවගේ සහභාගිත්වය" යන මැයෙන් පැවැති රචනා තරගයේ ජයග්‍රාහකයනට ත්‍යාග සහසහතික ප්‍රදානය ද මෙදින සිදු කරන ලදී.